කලාප අධ්‍යාපන කාර්යාලය - රත්නපුර

බහුවරණ ප්‍රශ්න සංග්‍රහය

විෂය - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය.

සකස් කළ ගුරුභවතාගේ නම - කේ. ඒ. ඩී. ආර්. කේ. කොතලාවල.

පාසල - ර/ උඩුමත්ත මිහිඳු මහා විද්‍යාලය.

ශ්‍රේණිය - 10 ශ්‍රේණිය.

පාඩම - ව්‍යාපාර සංවිධාන.

නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1) පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරිමේදී සලකා බලනු ලබන සාධක වන්නේ,

i. ලාභ ඉපයීම, සමාජ සුභසාධනය, සහ ප්‍රාග්ධන ප්‍රමාණය වේ.
ii. ව්‍යාපාරයට අදාළ වෙළඳපළ කොටස, ව්‍යාපාරයේ ප්‍රාග්ධන ප්‍රමාණය, හා සේවක සංඛ්‍යාව වේ.
iii. ලාභ ඉපයීම, ව්‍යාපාරයේ අරමුණ, හා භාවිතා කරන බලශක්ති ප්‍රමාණය වේ.
iv. පෞද්ගලික අංශයේ දායකත්වය, රාජ්‍ය අංශයේ දායකත්වය, හා රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ දායකත්වය වේ.

2) ***"සමීරා ස්වාධීන තීරණ ගැනීමට හා ඒ අනුව කටයුතු කිරීමට මෙන්ම; කැපවීම හා දක්ෂතාවය ද ඉහල මට්ටමක පවතින කාන්තාවකි."*** මේ අනුව සමීරාට වඩාත් පහසුවෙන් ආරම්භ කළ හැකි හා පවත්වාගෙන යා හැකි ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ,

i. ඒක පුද්ගල ව්‍යාපාරයකි.
ii. හවුල් ව්‍යාපාරයකි.
iii. සීමිත පෞද්ගලික සමාගමකි.
iv. සීමිත පොදු සමාගමකි.

3) කවිඳු හා රවිඳු හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. මෙම ව්‍යාපාරය තවදුරටත් පුළුල් කිරීමේ අවශ්‍යතාවයක් ඇති වූ බැවින්; ඔවුන් තම ව්‍යාපාරය සීමිත වගකීමක් සහිත ව්‍යාපාරයක් ලෙස ලියාපදිංචි කිරිමට තීරණය කරන ලදී. මෙම ලියාපදිංචිය කළ යුතු පනත වන්නේ,

i. 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත.
ii. 1918 ව්‍යාපාර නාම ආඥා පනත.
iii. 1840 වංචා වැළැක්විමේ පනත.
iv. 2007 අංක 07 දරණ සමාගම් පනත.

4) කොටස් නිකුත් කිරීම මගින් ප්‍රාග්ධනය සපයා ගන්නා ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක්ද?

i. රාජ්‍ය සංස්ථා.
ii. සීමා සහිත සමාගම්.
iii. හවුල් ව්‍යාපාර.
iv. රාජ්‍ය දෙපාර්තමේන්තු.

5) ව්‍යාපාර සංවිධාන කිහිපයක් පහත දැක්වේ.

A. තනි පුද්ගල ව්‍යාපාර
B. හවුල් ව්‍යාපාර
C. සීමිත සමාගම්
D. රාජ්‍ය සංස්ථා
E. රාජ්‍ය සමාගම්
F. රාජ්‍ය දෙපාර්තමේන්තු

මේවා අතරින් නෛතික පුද්ගලභාවයක් ඇති ව්‍යාපාර සංවිධාන ඇතුලත් පිළිතුර තෝරන්න.

i. A , B , හා C වේ.
ii. B , C , හා D වේ.
iii. C , D , හා E වේ.
iv. C , D , හා F වේ.

6) සංස්ථාපිත සමාගමක වාසි පමණක් ඇතුලත් පිළිතුර තෝරන්න.

i. අඛන්ඩ පැවැත්මක් පැවතීම , වගකීම අසීමිත වීම , නෛතික පුද්ගලභාවයක් පැවතීම.
ii. අඛන්ඩ පැවැත්මක් නොපැවතීම , වගකීම සීමා සහිත වීම , නෛතික පුද්ගලභාවයක් නොමැතිවීම.
iii. අඛන්ඩ පැවැත්මක් නොපැවතීම , වගකීම අසීමිත වීම , නෛතික පුද්ගලභාවයක් පැවතීම.
iv. අඛන්ඩ පැවැත්මක් පැවතීම , වගකීම සීමා සහිත වීම , නෛතික පුද්ගලභාවයක් පැවතීම.

7) ශ්‍රී ලංකාවේ **"වගකීම සීමිත"** ව්‍යාපාර සංවිධාන අඩංගු පිළිතුර තෝරන්න.

i. සමුපකාර , හවුල් ව්‍යාපාර , සීමා සහිත පොදු සමාගම්.
ii. කේවල ස්වාමී ව්‍යාපාර , හවුල් ව්‍යාපාර , සීමා සහිත පොදු සමාගම්.
iii. සීමා සහිත පොදු සමාගම් , සීමා සහිත පෞද්ගලික සමාගම් , සමුපකාර.
iv. කේවල ස්වාමී ව්‍යාපාර , හවුල් ව්‍යාපාර , සමිති සංවිධාන.

8) රාජ්‍ය දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

i. නෛතික පුද්ගලභාවයක් ඇත.
ii. අමාත්‍යාංශයක් යටතේ ක්‍රියාත්මක වේ.
iii. අයිතිය හා පාලනය රජය සතු වේ.
iv. රජයේ මූල්‍ය නීති සංග්‍රහයට අනුව කටයුතු කල යුතු වේ.

9) X තීරුවේ ව්‍යාපාර සංවිධානයන්ද, Y තීරුවේ ප්‍රකාශ කිහිපයක්ද සඳහන් වේ.

| X | Y |
|---|---|
| 1. හවුල් ව්‍යාපාර<br>2. සංස්ථාපිත සමාගම්<br>3. සමුපකාර සමිති<br>4. රාජ්‍ය සංස්ථා | A. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පැවතීම.<br>B. ලියාපදිංචිය අනිවාර්යය වීම.<br>C. විශේෂ හෝ පොදු පාර්ලිමේන්තු පනතකින් ආරම්භ වීම.<br>D. අවම සාමාජික සංඛ්‍යාව 02 හා උපරිමය 20 වීම. |

ඉහත X තීරුව සමඟ පිළිවෙලින් Y තීරුව ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

i. B , D , A , හා C වේ.
ii. D , A , C , හා B වේ.
iii. B , D , C , හා A වේ.
iv. D , B , A , හා C වේ.

10) ව්‍යාපාර ලියාපදිංචි කිරීම සම්බන්ධ පහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

i. සෑම ව්‍යාපාරයක්ම ලියාපදිංචි කිරීම තුලින් නීතිමය පුද්ගලභාවයක් ලැබීම.
ii. ව්‍යාපාර කටයුතුවල නිරත සියළුම ව්‍යාපාර ලියාපදිංචි කිරීම අනිවාර්යය වීම.
iii. සමාගමක් සංස්ථාපනය කිරීම මගින් නිතිමය පුද්ගලභාවයක් හිමිවීම.
iv. ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමෙන් නිතිමය පුද්ගලභාවයක් හිමිවීම.

**<u>පිළිතුරු පත්‍රිකාව</u>**

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|
| 01 | 02 | 06 | 04 |
| 02 | 01 | 07 | 03 |
| 03 | 04 | 08 | 01 |
| 04 | 02 | 09 | 04 |
| 05 | 03 | 10 | 03 |